# ඩී.එස්. සේනානායක විදුහල, කොළඹ 07.
## දෙවන වාර පරීක්ෂණය - 2015
## 6 ශ්‍රේණිය
## සිංහල භාෂාව හා සාහිත්‍යය

කාලය පැය 2 යි.

නම: .................................................................................. අංකය:- ................. පන්තිය:- ...........

### I - කොටස

**සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **හිස්තැනට සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.**

එළාර රජ 01) ........................ (බල / බළ) සම්පන්න කෙනෙකි. දුටුගැමුණු රජතුමා 02) ........................ (බළ / බල) සෙනඟ ගෙන යුද්ධයට ගියේය.

මගේ 03) .......................... (දන / දණ) හිස තුවාල විය. දූ 04) ........................ (දන / දණ) හා වාසය හොඳ නැත.

- **පහත සඳහන් නාමපද කවර පුරුෂයකට හා වචනයකට අයත් දැයි අදාළ කොටුවේ "✓" යොදමින් දක්වන්න.**

| නාම පදය | උත්තම පුරුෂ | | මධ්‍යම පුරුෂ | | ප්‍රථම පුරුෂ | |
|---|---|---|---|---|---|---|
| | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන | ඒක වචන | බහු වචන |
| 05) අපි | | | | | | |
| 06) ඔබ | | | | | | |
| 07) ඔහු | | | | | | |

- **සුදුසු සමාන පදය හා විරුද්ධ පදය බැගින් ලියන්න.**

| | සමාන පද | විරුද්ධ පද |
|---|---|---|
| 08) නින්දාව | .................................................... | .................................................... |
| 09) රෝගී | .................................................... | .................................................... |
| 10) ආරම්භය | .................................................... | .................................................... |

- **දී ඇති අකුරු වලට ඇලපිල්ල හා පාපිල්ල යොදා අර්ථවත් වචනය බැගින් ලියන්න.**

| | ඇලපිල්ල | පාපිල්ල |
|---|---|---|
| උදා : ත | තාත්තා | තුරු |
| 11) ක | .................................................... | .................................................... |
| 12) ද | .................................................... | .................................................... |
| 13) ර | .................................................... | .................................................... |

- **හිස්තැනට ගැළපෙන පදය වරහන් තුළින් තෝරා ලියන්න.**

14) මම ජයේ තාත්තාට දුරකථන ඇමතුමක් .......................................... (දෙමි / දුන්නෙමි)

15) .......................................... (මාළුවා / මාළුවෝ) වරල් සලමින් පීනති.

16) නංගි මල් .......................................... (නෙලුවේය / නෙලුවාය)

17) සැදෑ වලාපෙළ අහසේ .........................................., (පාවෙයි / පාවෙති)

18) .......................................... (මුවන් / මුවෝ) දළු කඩා මුව තුළ දමා ගනිති.

- **සුදුසු විරාම ලකුණු යොදන්න.**

19) යකැදුරා තදින්ම නටා අඩි බිම හප්පා කරකැවී කිරිහාමි දෙසට හැරුණේය

20) හිසත් පයත් සීතල වුණොත් තවත් මැරෙනවද

(ලකුණු 2x 20 = 40)

---

## II - කොටස

**පළමු ප්‍රශ්නය හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

**01) පහත සඳහන් ඡේදය ද ඇසුරු කරගෙන පිළිතුරු සපයන්න.**

එදින නිවාඩු දිනයක් බැවින් අපි වැවට ගොස් දිය නෑමට තීරණය කළෙමු. අම්මා රෙදි බාල්දිය ගෙන ඉස්සර වූවාය. <u>වැවේ දිය නාන මිනිසුන් දිය බුං ගසන හඬ ඇතින් ඇසෙන්නට විය.</u> "අද අපි වැවේ ඉහත්තාවටම පිනමු." මම යෝජනා කළෙමි.

The National e-Learning Portal for The General Education

i) මෙහි සඳහන් වන උත්තම පුරුෂ බහුවචන ක්‍රියාපදයක් ලියන්න. (ලකුණු 2)

ii) ඉරි ඇඳි වාක්‍යයේ උක්තය හා ආඛ්‍යාතය වෙන වෙනම ලියන්න. (ලකුණු 4)

iii) ක්‍රියාපදයක් තැබීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු අතරින් දෙකක් ලියන්න. (ලකුණු 4)

iv) පහත සඳහන් වගුවේ ඇති ක්‍රියාපද නිවැරදි කාලය, පුරුෂය හා වචනය ගැන සැලකිලිමත් වෙමින් නිවැරදි තීරුවේ "✓"ලකුණ යොදන්න.

| ක්‍රියා පදය | කාලය | | පුරුෂය | | | වචනය | |
|---|---|---|---|---|---|---|---|
| | අතීත කාල | අනතීත කාල | උත්තම පුරුෂ | මධ්‍යම පුරුෂ | ප්‍රථම පුරුෂ | ඒක වචන | බහු වචන |
| 1) ගියෙමි | ✓ | ............ | ............ | ............ | ............ | ............ | ............ |
| 2) දුවති | ............ | ............ | ............ | ............ | ............ | ✓ | ............ |
| 3) බැලුහ | ............ | ............ | ............ | ............ | ............ | ............ | ✓ |

(ලකුණු 6)

(ලකුණු 16)

**02) පහත සඳහන් රචනා මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 150 ට නොඅඩු රචනයක් ලියන්න.**

1) මා කියවූ හොඳම ළමා කතා පොත

2) මහ වැව් බැඳි අපේ රජවරු

3) ඉගෙනීමේ අගය

4) මම කුඩුවක හිරවූ ගිරවෙක්මි.

5) වනයක අසිරිය

(ලකුණු 10)

03) ඔබ මෙවර ත්‍යාග ප්‍රදාන උත්සවයේ දී 6 ශ්‍රේණියේ දක්ෂතම ශිෂ්‍යයාට හිමි ත්‍යාගය ඔබ දිනාගත්තේ යැයි සිතන්න. විදේශීය රටක වෙසෙන ඔබේ තාත්තාට ඒ පිළිබඳ විස්තර ලියා යවන ලිපියක් ලියන්න.
(වචන 100 ප්‍රමාණවත්ය.)

(ලකුණු 15)

04) **පහත සඳහන් කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

වෙසඟෙත් පොසොන් ඉන්පසු මේ ඇහැළ මහේ
ළඟ එන පුරා පෝයේ පණිවිඩය ඇහේ
මේ දවසටත් හැම බැතිමතෙකුම පහේ
දුර වන්දනාවක නොගිහින් සිටිය නොහේ.

යෞවන මහලු දරු හැම හදවතම පහේ
බැතිබර වෙමින් පෙර තිබූ දුක් අඳුරු නැහේ
පිටිසර ඇහැළ කුසුමින් කහ පැහැය ගැහේ
වෙහෙරේ සාදු හඬ ගම කෙළවරට ඇහේ

i) මෙහි ඇසළ යනුවෙන් සිංහල මාස ක්‍රමයට අනුව හැඳින්වෙන මාසය නූතන දින දර්ශනයේ සඳහන් වන්නේ කෙසේද?

ii) කවියේ සඳහන් වන වැදගත් පෝය දෙකක් සඳහන් කරන්න.

iii) ජීවිතයේ අවධි තුනක් ගැන මෙහි සඳහන් වේ. ඉන් දෙකක් ලියන්න.

iv) පෙර තිබූ දුක් දුරුවී යාමට හේතු මොනවාද?

v) ඉහත ගමේ මිනිසුන් ගැන ඔබට හැඟෙන දේ පේළි දෙකකින් ලියන්න. (ලකුණු 10)

The National e-learning Portal for the General Education

05) **පෙළපොත ඇසුරෙන් පිළිතුරු සපයන්න.**
"මේ වනයේ විෂ වෘක්ෂයෝත් අමනුෂ්‍යයි ගෘහිත වූ පුෂ්කරණීහුත් වෙති."

i) මෙසේ පවසන්නේ කවුද?

ii) මෙම අවවාදය ලබා දෙන්නේ කාහට ද?

iii) මෙම පාඨය උපුටාගත් කතා වස්තුවේ නම කුමක් ද?

iv) මෙය උපුටාගත් මුල් කෘතියේ නම කුමක් ද?

v) පුෂ්කරණීහු යන වචනයේ අරුත ලියන්න.

(ලකුණු 10)

06) **පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

දෙවන පැතිස් රජුගේ යුව රජු තනතුර උසුලනු ලැබුවේ මහානාග නම් ඔහුගේ සහෝදරයාය. ඔහු ජීවත් සිටියහොත් තම පුතුණුවන්ට රාජ්‍යය නොලැබෙන බව සිතූ දෙවන පැතිස් රජ බිසව, දවසක් මී අඹ පැසක් බහා, ඒ මත්තේ විෂ යෙදූ අඹ ගෙඩියක් ද තබා 'තරස්සා' නම් වැව බඳවමින් සිටි යුව රජුට යැව්වාය. ඒ දවස් සුළු පියාණන් සමග ගොස් සිටි රජ කුමරු, එයින් විෂය අඹය ගෙන කා එතනම කාල ක්‍රියා කළේය. යුව රජු කාරණය දැන රජ බිසවට භයින් තම නුවර නොගොස් තම බිසව හා බළ වාහන ගෙන රුහුණට පලා යන්නට විය. රුහුණේ මාගම තම රාජධානිය පිහිටුවා ගෙන රාජ්‍ය පාලනය කළේය.

i) දෙවන පැතිස් රජුගේ යුවරජු තනතුර ඉසිලුවේ කවුද?

ii) එම රජතුමාගේ සමයේ ඉදි කරන්නට යෙදුණු වැවක නමක් ලියන්න.

iii) බිසව තම පුතුට රජකම ලබා දීම සඳහා යෙදූ උපක්‍රමය කුමක් ද?

iv) පහත සඳහන් පදවලට සාමානාර්ථ පද ලියන්න.

අ) පැස

ආ) කාල ක්‍රියා කිරීම

v) මෙම ඡේදය ඇසුරෙන් ඔබට උගත හැකි පාඩම කුමක් ද? (ලකුණු 10)

**07) පහත සඳහන් ගීතය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

මිදුලේ වැලි මාලිගාවේ
සක්විති පදවිය ලබන්න
ගල්වැට ලඟ වාඩිවෙලා
සඳ පායන හැටි බලන්න

සතර දිසා ජයගෙන මම හනික එමි
ඔබේ ලොවට සඳ හිරු වී එළිය දෙමි

පිනා සිප් සයුර එතෙර
සියල් සතර දැන පිරිසිඳ
ලොවේ අනෙක අවමන් මැද නොසෙල්වෙමි.
මිනිස් මහිම දෝතින් ගෙන සිනාසෙමි.

i) ගීතයේ සඳහන් ආකාරයට සතර දිශා ජයගත හැක්කේ කෙසේද?

ii) ශිල්ප ලබා දරුවා දෙමාපියන්ගේ ජීවිත ද ආලෝකමත් කරවන බව කියවෙන ගී පේළිය උපුටා ලියන්න.

iii) ලෝකයෙන් එල්ල වන අනේක විධ චෝදනා හා අවමානයන් හමුවේ කටයුතු කළ යුත්තේ කෙසේද?

iv) යම්කිසි කටයුත්තක නිරත වීමේ දී සැලකිලිමත් විය යුත්තේ කුමක් ගැනද?

v) මෙම ගීතය කියවීමෙන් ඔබ ලබාගත් ආදර්ශයක් ලියන්න.

(ලකුණු 10)

********